# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2025 (2026)

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහා වන ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය **2026 මාර්තු මස කොළඹ දී** පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "අපගේ සේවා" යටතේ ඇති "මාර්ගගත අයදුම්පත් (බඳවාගැනීම්/කාර්යක්ෂමතා කඩඉම් විභාග)" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි.

මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 නොවැම්බර් මස 24 දින පෙ.ව. 09.00** ට විවෘත වන අතර **2025 දෙසැම්බර් මස 26 දින ප.ව. 09.00** ට අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. විදුහල්පති සේවයේ සෑම නිලධාරියකු ම බඳවා ගැනීමේ දින සිට වසර (03) තුනක් ඇතුළත සන්ධාන භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය. ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 8/2020 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීම තුළින් මෙම පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් විය හැකිය. එසේ නොමැති සෙසු නිලධාරින් මෙම පරීක්ෂණය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* පළකර ඇත. ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විතවන අතර, අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂයය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂයය නිර්දේශය පහත පරිදි වේ:

(1) සාමාන්‍ය ඉංග්‍රීසි (General English)
ලකුණු 100 - කාලය පැය 03

විෂයය නිර්දේශය :

Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate:-

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

The knowledge on the modern formats and styles of writing is tested in following area of study:-

- Summary writing
- Report writing
- Essay writing

04. සාමර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. විභාග අපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු නොකරනු ඇත.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු

සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්‍ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහාවන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම් පත්‍ර **2025 දෙසැම්බර් මස 26** දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයට ලැබෙන පරිදි විදුහල්පති / කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්‍ෂ /කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ හෝ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ / පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම පැහැදිලිව ලිවිය යුතු අතර මෙදිනට පසු එවනු ලබන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේනොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

09. විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතුයි. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(i.) ජාතික හැඳුනුම්පත,
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළැඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු යි.

11. විභාග ගාස්තු : විභාග ගාස්තුව රු. 250.00 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය:

(i.) ඕනෑම බැංකු කාඩ්පතක් මගින්
(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්
(iii.) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින්
(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණ වේ.

13. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

14. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2025 නොවැම්බර් මස 14 දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11 - 338

---

## මොරටුව විශ්ව විද්‍යාලයීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2025/2026

මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය මගින් පවත්වනු ලබන තුන් අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම පිණිස සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව, **හෝමාගම, දියගම පිහිටි මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තුළ පැවැත්වෙනු ඇත.**

**01. සාමාන්‍ය :**

ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව දැ අවුරුදු අධ්‍යයන හා එක් අවුරුදු ප්‍රායෝගික කාර්මික පුහුණුවකින් ද සමන්විත වේ. පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත් වේ. මෙම පාඨමාලාවේ දී පහත සඳහන් විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අවස්ථාව ලැබේ:

(අ) නාවුක අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 1)
- i. නාවුක ඉංජිනේරු තාක්ෂණය
- ii. නෞකා චලන අධ්‍යයනය

(ආ) අනෙකුත් අධ්‍යයන ක්ෂේත්‍ර කාණ්ඩය (Set 2)
- i. රසායන ඉංජිනේරු තාක්ෂණය
- ii. සිවිල් ඉංජිනේරු තාක්ෂණය
- iii. විදුලි ඉංජිනේරු තාක්ෂණය
- iv. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු තාක්ෂණය
- v. තොරතුරු තාක්ෂණය
- vi යාන්ත්‍රික ඉංජිනේරු තාක්ෂණය
- vii. බහු අවයවික (පොලිමර්) තාක්ෂණය
- viii. පේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණය

**02. යෝග්‍යතාවය**

2.1. වයස :

2.1.1 2024.12.31 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 24ට වැඩි නොවිය යුතු ය.

2.1.2. නෞකා චලන අධ්‍යයනය හා නාවුක ඉංජිනේරු තාක්ෂණය යන විෂයය ක්ෂේත්‍රයන් හැදෑරීමට අපේක්ෂකයන් තෝරා ගැනීමේ දී 2024.12.31 දිනට වයස අවුරුදු 20ට අඩු අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ. එම විෂයය ක්ෂේත්‍රයන් සඳහා සිසුන් තෝරා ගැනීමේ දී විශේෂ වෛද්‍ය පරීක්ෂණයකට හා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් විය යුතු වේ.

2.1.3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව යටතේ ඇති ඕනෑම විශ්වවිද්‍යාලයක (විවෘත විශ්වවිද්‍යාල හැර) හෝ උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක පූර්ණකාලීනව ලියාපදිංචි වී ඇති සිසුන් **මෙම පාඨමාලාව සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.**

# Examinations, Results of Examinations & c.

## MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

### English Language Examination for Sri Lanka Principal Service – 2025 (2026)

IN terms of the Service Minute of the Sri Lanka Principals' Service No. 1885/31 dated 22.10.2014, it is hereby notified that the English language Examination for the officers in the Sri Lanka Principals' Service will be conducted in **March 2026** in Colombo.

Applications have been published through "Online Applications- Recruitment Exams/E.B. Exams" available under "Our Services" of the website www.doenets.lk of the Department of Examinations, Sri Lanka whereas applications can only be submitted *via* online. Online applications can be submitted form **9.00 a.m. on 24th of November, 2025** to **9.00 p.m. on 26th of December, 2025**. Followed by being applied *via* online, it must be downloaded and the signature of the applicant must be authenticated after being filled this with handwriting must be sent to the Department of Examinations, Sri Lanka by registered post, on or before the date of close of applications together with the certification by the relevant head of the institution.

Any type of disturbance incurred due to delaying in the forwarding of application up until the deadline should be borne by the applicant.

02. Every Officer of the Sri Lanka Principals' Service should acquire proficiency in the Link Language within three (03) years from the date of recruitment. In case Officers who have fulfilled the qualifications mentioned in the Circular No.08/2020 of the Public Service Commission, shall be exempted from the requirement of passing this Link Language (English) Examination. All Other Officers should pass this Examination.

03. The syllabus related to this examination and the other provisions have been published in the *Gazette Extraordinary* No. 1885/31 dated 22nd October 2014 of the Democratic Socialist Republic of Sri Lanka. The syllabus and the other provisions have been mentioned here for the convenience of the candidates.

(a) Examination Procedure – The Syllabus as follows :-
 (1) General English - Marks 100 – Time 03 Hours

**The Syllabus**

A suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate :-

- Tenses and numbers;
- Sentences(simple/compound/complex/ compoundcomplex);
- Relative clauses;
- Reported speech;
- Adjectives and adverbs;
- Determiners;
- Prepositions.

The knowledge on the modern formats and styles of writing is tested in following area of study:-

- Summary writing;
- Report writing;
- Essay writing.

04. A candidate should score minimum 40% or above for this subject in order to pass the exam.

4.1 The result sheet including the results of all candidates faced the examination will be provided to the Secretary of the Ministry of Education, Higher Education and Vocational Educational Education. Personal result sheets will not be issued for candidates by the Commissioner General of Examinations.

05. The online application form must be completed in English only. Verification of the soft copy and printed copy is carried out after the receipt of both copies which are uploaded *via* online by the applicant and printed copy forwarded by registered post whereas you will be notified by a SMS to the mobile phone number which used for accessing in to the system or by an E-mail whether your application has been accepted or not accepted as a valid application. Before completing the online application form, download the instructions for applying for the examination. Follow the instructions carefully while filling the application form. Any amendment made to the application form after receiving a printed copy will not be considered a valid amendment. Incomplete applications will be rejected without notice.

06. The Examination will be conducted by the Commissioner General of Examinations and Candidates are bound to adhere to the Rules and Regulations that are imposed in relation to the Examination. Rules and Regulations for the Examination have been published at the end of this *Gazette* Notification.

07. The applications should be sent through registered post only through the Principal /Divisional Directors of Education/ Zonal Directors of Education or Additional Provincial Director of Education/ Provincial Director of Education or through your Head of the Institution to reach "The Commissioner General of Examinations, Institutional Examinations Organization Division, Department of Examinations Sri Lanka, Pelawatta, Battaramulla, on or before **26th December 2025**. The title of the examination should be clearly mentioned on the top left-hand corner of the envelope and applications sent after this date shall be rejected.

08. On the premise that only those who meet the qualifications specified in the Gazette Notification have applied, the Commissioner General of Examinations will issue examination admissions online only to those candidates who have submitted duly completed applications along with the relevant receipt and paid the prescribed examination fee on or before closing date of the receipt of applications. As soon as the examination admissions are issued, the Department of Examinations of Sri Lanka will inform the candidates about it through a web notification/SMS message. If a candidate has not received his/her admission, he/she should enquire about it from the Institutional Examinations Organization Branch of the Department of Examinations, Sri Lanka as mentioned in the advertisement. When making such enquiry, it would be more effective for the candidate to send a request letter to the email address mentioned in the web notification, stating the name of the examination he/she has applied for, the full name of the candidate, the National Identity Card number and address correctly. It would be useful to have a photocopy of the completed application form, a photocopy of the receipt for payment of the examination fee and the registered receipt for mailing the application ready to support any information sought by the Examination Department. After checking the admission card, if any amendments are required, the Department of Examination should be contacted as early as possible and the relevant amendments should be made as per the application. Requests for amendments made in the examination hall will not be considered.

09. The signature of the candidate should have been certified in the application and the admission. The candidate should get the signature certified by the Head of Institute or by an officer who is authorized by the Head of Institute. A candidate who does not submit his/her admission formally is not permitted to sit the Examination.

10. Submission of proofs to substantiate the identity at the examination hall for each subject is the responsibility of the candidates. Any of following documents is accepted herein.

(i) National Identity Card,
(ii) Valid Passport, or
(iii) Valid Driving License of Sri Lanka.

Further, the Candidates should enter the examination hall without covering the face and the ears so that their identity can be confirmed. Those who refuse to prove their identity will not be allowed to enter the examination hall. Moreover, the candidates should remain without covering the face and the ears from the moment they enter the examination hall until they leave the hall after finishing the examination so that the officials are able to identify the candidates.

**11. Examination Fees:** The examination fee is two hundred and fifty rupees (Rs. 250/-). Payment of the examination fee should be made only through the following payment methods provided in the online system.

i. By any Bank Credit Card,
ii. By any Bank Debit Card with the Facility of Internet transaction,
iii. Online Banking Method of Bank of Ceylon,
iv. Any branch of the Bank of Ceylon.

*(a)* Instructions on as to how payments should be made using the above methods are published on the website under the technical instructions related to the examination.

*(b)* Payment will be acknowledged *via* SMS or email. The full examination fee must be paid and applications with under or overpayment will be rejected. The Department of Examinations, Sri Lanka will not be held responsible for any errors that may occur in the payment of examination fees through the above payment methods.

*(c)* The amount paid for the examination will not be refunded or transferred to another examination for any reason.

12. Candidates will be subjected to the rules and regulations imposed by the Commissioner General of Examinations on conducting examinations and issuing results. It is notified that he/she will be subjected to any punishment imposed by the Commissioner General of Examinations in case such rules and regulations are violated.

13. In case of any inconsistency among Sinhala, Tamil and English texts of this notification the Sinhala text shall prevail.

14. Furthermore, the Secretary to the Ministry of Education, Higher Education and Vocational Education reserves the right of determining any matter not covered by this notification.

**Nalaka Kaluwewa,**
Secretary,
Ministry of Education, Higher
Education & Vocational Education.

Ministry of Education,
Higher Education and Vocational Education,
Isurupaya, Pelawatta, Battaramulla,
On this 14th day of November 2025.

11-338

---

## INSTITUTE OF TECHNOLOGY UNIVERSITY OF MORATUWA

### Admission to the National Diploma in Technology Course - 2025/2026

APPLICATIONS are invited from eligible candidate for admission to the National Diploma in Technology, 3-year fulltime course conducted by the Institute of Technology, University of Moratuwa. The Course will be conducted in the Institute of Technology, University of Moratuwa at Diyagama, Homagama.

**1. General**

The National Diploma in Technology Course consists of two years of academic study and one year of Industrial Training and is conducted in English Medium. The course is offered in the following of study:

*a)* Maritime studies Courses (Set 1)
i. Marine Engineering Technology
ii. Nautical Studies

*b)* Other fields of Study Courses (Set 2)
i. Chemical Engineering Technology
ii. Civil Engineering Technology
iii. Electrical Engineering Technology
iv. Electronic & Telecommunication Engineering Technology
v. Information Technology
vi. Mechanical Engineering Technology
vii. Polymer Technology
viii. Textile & Clothing Technology

**2. Eligibility**

*2.1 Age:*

2.1.1 Applicants should be below 24 years of age on 31.12.2024.

2.1.2 Applicants below 20 years of age on 31.12.2024 will be given preference for admission to the Marine Engineering Technology and Nautical Studies Courses. A special medical test & interview would also be conducted for selection of students to Marine Engineering Technology and Nautical Studies Courses.

2.1.3 Those who are registered as full time students of any University under the UGC (except the Open University of Sri Lanka) or Higher Educational Institute under the Ministry of Higher Education are not eligible to apply for this course.